**ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමණාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 06 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත.

මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගතවී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලකාදීමෙහිලා පාර්ලිමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල නොකිරීම.<br>2. ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු නොකිරීම.<br>3. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම<br>4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>5. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනයේ අඩුපාඩු<br>6. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.1.1<br>2.1.2<br>2.3.1<br>2.3.2<br>2.6<br>2.10 |
| 128(1)(ආ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |
| 128(1)(ඉ) | රජය සතුවූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාෂණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |

| | | | |
|---|---|---|---|
| | අනුකූලව කරනු ලබන බව | | |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම. | 2.1.3 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**
-----------------------------------------------------

**2.1 කාර්යසාධනය**
---------------

**2.1.1 සැලසුම් කිරීම**
--------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 9 ක් පැවති අතර දෙපාර්තමේන්තුව අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මහාභාණ්ඩාගාරයෙන් මෙම දෙපාර්තමේන්තුවට ලද ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආයතනවලින් "මෙත් සිත් අරණ වැඩසටහන" යටතේ විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබී තිබුණු නමුත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට එම කාර්යයන් ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික අයවැය, ක්‍රියාකාරකම් කාල රාමුව හා අපේක්ෂිත නිමවුම අනුව ප්‍රමුඛතාවය මත පදනම්ව පිළියෙල කළ ක්‍රියාකාරකම් සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අග්‍රිම අවශ්‍යතා සැලැස්ම, ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**
-------------------------------

**ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**
-----------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 9 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 4 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් 5 සඳහා එකතුව රු. මිලියන 196.4 ක ප්‍රතිපාදන සලසා තිබුණි.
ක්‍රියාකාරී සැලැස්ම අනුව ලෝලුගස්වැව නගර සංවර්ධන කාර්යභාරය ඉටු කිරීමෙන් අනුරාධපුර නගර සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණත් අනුමැතීන් ලබා ගැනීම ප්‍රමාද වීම, ශක්‍යතා වාර්තා ලබා

ගැනීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදනයන් සැලසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකි වීම නිසා එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

---------------------------------

**2.2.1 ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා ප්‍රාරම්භක අවධිය**

--------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1 මාර්ගෝපදේශය පරිදි එළඹෙන වර්ෂයට අදාල විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැයෙහි යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් රු.මිලියන 01 ක් වෙන්කර තිබුණද, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) කාර්යාල උපකරණ මිලදී ගැනීමේ කටයුතු 2017 පෙබරවාරි 28 දින වන විට අවසන් කළ යුතු වුවද, එසේ අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීම හෝ සිදුකර නොතිබුණි.

(iii) 2017 සැප්තැම්බර් මස මිලදී ගත් රු. 624,150 ක උපකරණ සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු සඳහා ආයතන දෙකකින් මිල ගණන් ඉදිරිපත් කරනු ලැබුවද මිල ගණන් විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණු අතර, මිල ගණන් විවෘත කිරීමේ වාර්තාවල ඒ සඳහා බලයලත් නිලධාරීන් විසින් අත්සන් කර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.1 හා 4.4 යන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම නියාමනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු නොකිරීම නිසා ප්‍රසම්පාදන සැලැස්ම අනුව කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 2.00 ක් වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 6.257 ක් දක්වා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(v) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු.මිලියන 197.5 ක් වූ වැඩ/ භාණ්ඩ 06 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

(vi) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොකළ රු.1,210,403 ක් වූ කාර්යයන් 4 ක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණි.

(vii) මෝටර් රථයක් අළුත්වැඩියා කටයුතු සඳහා අවසථා කිහිපයකදී මිල ගණන් කැඳවා එම මිල ගණන් අහෝසි කර, නැවත නැවත මිල ගණන් කැඳවීම තුලින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව සිදු නොවීම මත දෙපාර්තමේන්තුවට රු.53,620 ක අලාභයක් සිදු වී තිබුණි.

(viii) රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු විසින් ලංසු ඇගයීමේ සාරාංශ වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

2017 ජුනි 28 දිනැති අංක 2017/01 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවන ලද වත්කම් ලේඛනවල ඇතුළත් වත්කම් වටිනාකම හා විසර්ජන ගිණුමේ ඇතුළත් ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ වටිනාකම අතර රු. 72,357,395 ක වෙනසක් නිරීක්ෂණය විය.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වටිනාකම රු.6,330,000 ක් වූ මෝටර් වාහන 05 ක් මාස 06 සිට මාස 12 ක් දක්වා කාලයක්ද, වටිනාකම රු.7,965,000 ක් වූ ගොඩනැගිලි 03 ක් 2010 වසරේ සිට 2018 සැප්තැම්බර් 06 දින දක්වාද නිෂ්ක්‍රීයව පැවතුණි.

### (ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2017 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.4 හානි හා පාඩු

දෙපාර්තමේන්තුව සතු අංක 57-9387 දරන වාහනය රක්ෂණය කර නොතිබුණු අතර 2014 පෙබරවාරි 26 දින අනතුරට ලක් වී තිබුණි. අනතුරෙන් පසුව කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබියදී යථෝක්ත වාහනයේ ලයිට් යුගලය, කැසට් යන්ත්‍රය හා රියදුරු අසුන සොරකම් කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

## 2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.385,569 ක ගෙවීම් වවුචර් සඳහා අදාල බිල්පත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 145.1 | 140.5 | 4.6 | 3.2 |
| | මූලධන | 11.8 | 11.7 | 0.1 | 0.8 |
| | **එකතුව** | **156.9** | **152.2** | **4.7** | **3.0** |
| 2014 | පුනරාවර්තන | 153.3 | 150.6 | 2.7 | 1.8 |
| | මූලධන | 9.7 | 7.4 | 2.3 | 23.7 |
| | **එකතුව** | **163.0** | **158.0** | **5.0** | **3.1** |
| 2015 | පුනරාවර්තන | 179.2 | 169.0 | 10.2 | 5.7 |
| | මූලධන | 13.0 | 7.6 | 5.4 | 41.5 |
| | **එකතුව** | **192.2** | **176.6** | **15.6** | **8.1** |
| 2016 | පුනරාවර්තන | 182.7 | 175.9 | 6.8 | 3.7 |
| | මූලධන | 109.1 | 8.4 | 100.7 | 92.3 |
| | **එකතුව** | **291.8** | **184.3** | **107.5** | **36.8** |
| 2017 | පුනරාවර්තන | 181.0 | 174.4 | 6.6 | 3.6 |
| | මූලධන | 211.4 | 16.0 | 195.4 | 92.4 |
| | **එකතුව** | **392.4** | **190.4** | **202.0** | **51.5** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.191,900 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 196.94 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 11.28 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් එකතුව රු.39,086,409 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් එකතුව රු.7,839,649 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.31,246,760 ක් හෙවත් ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 80 ක ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි.

**2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

--------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

--------------------------------------------------

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 31101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 12.00 **හි** | 11.43 | 8.00 | 8.75 | 50.00 | 34.64 |

**හ**

**හිටි ශේෂ අයකර නොගැනීම**

--------------------------------------

විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.574,630 ක් වූ අතර එය වර්ෂ 05 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණු අතර මෙම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.8 අග්‍රිම ගිණුම්**

--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 19 දෙනෙකුට අවස්ථා 137 කදී එකතුව රු. 1,227,210 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) ඉහත සඳහන් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 07 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු. 111,250 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 15 ක සිට දින 37 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

**2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර වාහන හැර අනෙකුත් වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන පවත්වා නොතිබුණි.

## 2.10 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර තිබූ සමහර කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉටුකර නොතිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 129.928 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒකපුද්ගල වියදම රු. 460,739 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 51 | 11 | 40 |
| (ii) | තෘතීයික මට්ටම | 08 | 01 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 114 | 78 | 36 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 205 | 192 | 13 |
| | එකතුව | 378 | 282 | 96 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 96 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් හා විධායක මට්ටමේ පුරප්පාඩු 38 ක් ද ඒ තුළ විය.

(ආ) සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් සඳහා වූ පුරප්පාඩු වසර ගණනාවක සිට පැවතීම හේතුවෙන් එම තනතුරු වල රාජකාරි ආවරණය කිරීම සඳහා නිලධාරීන් 03 දෙනෙකු 2015 නොවැම්බර් 20 දින සිට පත්කර තිබුණු අතර එම නිලධාරීන් අතර 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම රාජකාරි ආවරණ කටයුතු වල නිරතව සිටි බව නිරීක්ෂණය විය.

**(ඇ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුවේ ද්විතියික මට්ටමේ නිලධාරීන් 36 ක් සඳහා පුරප්පාඩු තිබියදී , දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබූ මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | මුදාහැර ඇති අමාත්‍යාංශ | මුදාහැර තිබූ වර්ෂය |
|---|---|---|---|---|
| (i) | සංවර්ධන සහකාර | 01 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 2017 |
| (ii) | සංවර්ධන නිලධාරී | 03 | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 2017 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | සැලසුම් ශිල්පී | 01 | -එම- | 2017 |